(121)


දුරකථන / தொலைபேசி / Telephone: 2329270 කොමසාරිස්, 2326075, 2329102, 2348228
ෆැක්ස් / பெக்ஸ் இல. / Fax: 2329270
විදුලි පණිවුඩ / தந்தி / Telegrams: සමුපකොම / கூட்டுறவாணை / CREDIT

මගේ අංකය / எனது இல. / My No.: සමු/ටෙ/1/CCD/01
ඔබේ අංකය / உமது இல. / Your No.:

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## බස්නාහිර පළාත

තැ.පෙ.444, ආදිපාද වීදිය, කොළඹ 01.

கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
மேல் மாகாணம்,
தபாற் பெட்டி 444, டியூக் வீதி, கொழும்பு- 01

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT
WESTERN PROVINCE
P.O.Box.444, Duke Street , Colombo 01


2023.03. 10

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 3/2023 (01)

බස්නාහිර පළාත් සියලුම සමුපකාර සමිති වල හා

සංගම් වල ගරු සභාපති/ලේකම්/සාමාන්‍යාධිකාරී වෙත

**පළාත් පාලන,පළාත් සභා,පාර්ලිමේන්තු ජන්ද විමසීම් අවස්ථා වල අපේක්ෂකයක් ලෙස තරඟ කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 03/2023 හා 2023.01.23 දිනැති චක්‍රලේඛයට වැඩිමනක් වශයෙනි.

02. මේ වන විට පළාත් පාලන ,මැතිවරණය සඳහා දින නියම කිරීම හා ඒ සම්බන්ධයෙන් පවතින තත්වයන් සැලකිල්ලට ගනිමින් සමුපකාර සමිති සේවකයන් සම්බන්ධයෙන් උක්ත චක්‍රලේඛයේ 2 ජේදයේ සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධනය කරමි.

03. ඒ අනුව 2023 පලාත් පාලන ජන්දය සඳහා පමණක් වන පරිදි මෙම සංශෝධනය කරන අතර ඉදිරියේ දී ජන්ද දින නියම කර මැතිවරණ ප්‍රචාරණ කටයුතු අවසන් කරන දිනයට සති දෙකකට එනම් දින දාහතරකට පෙර දින දක්වා කාලය සඳහා , සමිතියේ සේවකයන්ට තම සේවයට පැමිණීමට අවස්ථාව සැලසීමට කටයුතු කරන ලෙසත් එදිනෙන් පසුව නැවත උක්ත චක්‍රලේඛය එලෙසින්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත්, වන පරිදි අදාළ චක්‍රලේඛ විධි විධාන සංශෝධනය කරමි. කෙසේ නමුත් එහි 2 ජේදයෙහි අනෙකුත් සියලු කරුණු එලෙසම ක්‍රියාත්මක වේ .

04.තවද මැතිවරණයට අදාළ කිසිදු කටයුත්තකට සමිති පරිශ්‍ර, ගොඩනැගිලි හා ව්‍යාපාරික ස්ථාන භාවිතා කිරීමට කිසිදු අවස්ථාවක සේවකයින්ට ලබා නොදිය යුතුය.

රුවිනි ඒ.විජයවික්‍රම
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් (වැ.බ)
බස්නාහිර පළාත